# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

## 2025 අධ්‍යයන වර්ෂය

මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2024.11.27 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### *1. එක් අවුරුදු බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (P.G.D.) (SLQF 08 - 25 Credits)*

අධ්‍යයන මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව : දේශීය සිසුන් සඳහා - රු. 31,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 405

<u>ලියාපදිංචිය සඳහා සුදුසුකම්</u>

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.
  හෝ
- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**පාඨමාලා ව්‍යුහය**

ඒකක 05ක් ඇතුළත් වේ. සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වේ.

| | | | |
|---|---|---|---|
| බුදුසමයේ මූලික ඉගැන්වීම් | - PGBS 53015 | Fundamental Teachings in Buddhism | - PGBS 53015 |
| බෞද්ධ සමාජ දර්ශනය | - PGBS 53025 | Buddhist Social Philosophy | - PGBS 53025 |
| ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ නූතන ප්‍රවණතා | - PGBS 53035 | New Trends of Buddhist Culture in Sri Lanka | - PGBS 53035 |
| මහායාන බුදුසමය - මූලධර්ම | - PGBS 53045 | Mahayana Buddhism – Principles | - PGBS 53045 |
| බුදුදහම හා සමාජ ගැටලු | - PGBS 53055 | Buddhism and Social Issues | - PGBS 53055 |

### *2. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (M.A.) (SLQF 09 - 30 Credits)*

අධ්‍යයන මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව : දේශීය සිසුන් සඳහා - රු. 45,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 555
අධ්‍යයන විෂය ධාරාව : බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/සංස්කෘත/ඉංග්‍රීසි

<u>ලියාපදිංචිය සඳහා සුදුසුකම්</u>

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්

### *3. ශාස්ත්‍රපති (දෑවුරුදු) පර්යේෂණ උපාධි පාඨමාලාව (M.A.) (SLQF 10 - 60 Credits)*

අධ්‍යයන මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව : දේශීය සිසුන් සඳහා - රු. 74,500/-
විදේශීය සිසුන් සඳහා - US$ 705
අධ්‍යයන විෂය ධාරාව : බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/සංස්කෘත/ඉංග්‍රීසි

<u>ලියාපදිංචිය සඳහා සුදුසුකම්</u>

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්
හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.

**පාඨමාලා ව්‍යුහය**

ලිඛිත ප්‍රශ්න පත්‍ර 06ක් ඇතුළත් වේ. සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වේ.

| **<u>බෞද්ධ අධ්‍යයන</u>** | | **<u>Buddhist Studies</u>** | |
|---|---|---|---|
| බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - MABS 53015 | Philosophical Trends in Buddhism | - MABS 53015 |
| බුදුසමය හා සමයාන්තර දර්ශනය | - MABS 53025 | Buddhism and Inter-Religious Philosophy | - MABS 53025 |
| බුදුදහම හා කළමනාකරණය | - MABS 53035 | Buddhism and Management | - MABS 53035 |
| බෞද්ධ මනෝ චිකිත්සාව | - MABS 53045 | Buddhist Psychotherapy | - MABS 53045 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |
| බෞද්ධ සමාජ දර්ශනය හා නූතන ලෝකය | - MABS 53055 | Buddhist Social Philosophy and Modern World | - MABS 53055 |
| **හෝ** | | **Or** | |
| ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා හා වාස්තු විද්‍යාව | - MABS 53075 | Buddhist Art and Architecture | - MABS 53075 |

| **පාලි** | | **Pali** | |
|---|---|---|---|
| බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - MABS 53015 | Philosophical Trends in Buddhism | - MABS 53015 |
| පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය | - MAPL 53025 | Pali Prescribed Texts | - MAPL 53025 |
| පාලි ව්‍යාකරණ හා ගද්‍ය පද්‍ය රචනා | - MAPL 53035 | Pali Grammar and composition of prose and verse | - MAPL 53035 |
| නිකායාන්තර පිටක සාහිත්‍යය | - MAPL 53045 | Literature of Inter – Sectarian Texts | - MAPL 53045 |
| පාලි කාව්‍යය හා සාහිත්‍ය විචාරය | - MAPL 53055 | Pali Poetry and Literary Criticism | - MAPL 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |

| **සංස්කෘත** | | **Sanskrit** | |
|---|---|---|---|
| බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - MABS 53015 | Philosophical Trends in Buddhism | - MABS 53015 |
| නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - I | - MASN 53025 | Study of Prescribed Texts - 1 | - MASN 53025 |
| නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - II | - MASN 53035 | Study of Prescribed Texts - 11 | - MASN 53035 |
| නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - III | - MASN 53045 | Study of Prescribed Texts – 111 | - MASN 53045 |
| භාරතීය සංස්කෘතිය හා ශිෂ්ටාචාරය | - MASN 53055 | Indian Culture and Civilization | - MASN 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |

| **සිංහල** | | **English** | |
|---|---|---|---|
| ජනශ්‍රැතිය හා ජනජීවන අධ්‍යයනය | - MASI 53015 | Philosophical Trends in Buddhism | - MABS 53015 |
| චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යය | - MASI 53025 | Dramatic Genres | - MAEN 53025 |
| චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යය | - MASI 53035 | Literary Traditions in Poetry | - MAEN 53035 |
| සිංහල භාෂාවේ ඉතිහාසය හා ව්‍යාකරණ ශාස්ත්‍රය | - MASI 53045 | Themes in Fiction | - MAEN 53045 |
| වර්තමාන සිංහල සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය | - MASI 53055 | Language Pedagogy | - MAEN 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |

**අයදුම්පත් ගාස්තුව :**

බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි (එක් අවුරුදු/දෑවුරුදු) - රු. 1000/-

**අයදුම් කළ යුතු පිළිවෙල :**

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක **711202** ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගත හැකි ය. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 110/ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'අයදුම්පත්‍ර ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතු ය. (P.G.D./M.A.)**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

සැලකිය යුතුයි : **ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි විෂය ධාරාවෙන් පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම්, ශාස්ත්‍රවේදී (විශේෂ/සාමාන්‍ය) උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

**හෝ**

**ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යය/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්වවිද්‍යාලයකින් පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.**

**සහ**

**එම අපේක්ෂකයන් ඉංග්‍රීසි අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් වීම හා සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.**

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය**

පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) පාඨමාලා සඳහා **2024.11.25** දින දක්වා පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.11.27** දිනට පෙර ඉහත ලිපිනයට යොමු කළ යුතු ය.

වැඩි විස්තර සඳහා : 0112580609